ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2310/07 - 2022 දෙසැම්බර් මස 12 වැනි සඳුදා - 2022.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි 05 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 51 වගන්තිය යටතේ වූ නිවේදනයයි

**නිවේදනය**

කලින් කල සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ, 17 වන වගන්තිය යටතේ 2022.12.05 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදන* අංක 2309/04 මගින් ඇතුළත් කරන ලද ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් නව ඡේදයක් ඇතුළත් කොට සංශෝධනය කරනු ලැබේ.

විශේෂඥ වෛද්‍ය නිලධාරී/රජයේ වෛද්‍ය නිලධාරී/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී/රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරී යන තනතුරුවල අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව පහත පරිදි සංශෝධනය වන්නේය.

(*අ*) දැනටමත් වයස අවුරුදු 63 සම්පූර්ණ කර ඇති වෛද්‍යවරුන් 2022 දෙසැම්බර් මස 31 දිනට ප්‍රථම විශ්‍රාම ගැන්වීම.

(*ආ*) මේ වන විට වයස අවුරුදු 62 සම්පූර්ණ වී ඇති වෛද්‍යවරුන් තම වයස අවුරුදු 63 සම්පූර්ණ වීමේදී විශ්‍රාම ගැන්වීම.

(*ඇ*) මේ වන විට වයස අවුරුදු 61 සම්පූර්ණ වී ඇති වෛද්‍යවරුන් තම වයස අවුරුදු 62 සම්පූර්ණ වීමත් සමග විශ්‍රාම ගැන්වීම.

(*ඈ*) මේ වන විට අවුරුදු 60 සම්පූර්ණ වී ඇති වෛද්‍යවරුන් තම වයස අවුරුදු 61 සම්පූර්ණ වීමත් සමග විශ්‍රාම ගැන්වීම.

(*ඉ*) මේ වන විට වයස අවුරුදු 59 සම්පූර්ණ වී ඇති වෛද්‍යවරුන් තම වයස අවුරුදු 60 සම්පූර්ණ වන විට විශ්‍රාම ගැන්වීම


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේ වුවද, ජනවාරි මස 01 වැනි දින සිට ජුනි මස 30 වැනි දින දක්වා වන කාල සීමාව තුළ තම උපන් දිනය යෙදෙන විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, රජයේ වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ට අදාළ වර්ෂයේ ජුනි මස 30 වැනි දින දක්වා සේවය කිරීමට අවස්ථාව සලසා දී විශ්‍රාම ගැන්වීම සහ ජුලි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වන කාල සීමාව තුළ තම උපන් දිනය යෙදෙන විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, රජයේ වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සහ රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ට අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා සේවය කිරීමට අවස්ථාව සලසා දී විශ්‍රාම ගැන්වීම සිදුකළ යුතුය.

මෙම අන්තර්කාලීන විධිවිධාන 2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන්නේය.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය හා
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 12 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

EOG 12 - 0128

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.